

# මී පැංචාට උදව්වක්

හෙසන්යා අල්වීර

මී පැංචාට උදව්වක්

හෙසන්යා අල්වීර

කතෘ ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය - 2023

ISBN 978-624-206-687-5

<u>කර්තෘගේ වෙනත් කෘති</u>

කළු කිටියා

සුපුන්ගේ හොඳම යාළුවා

මගේ නංගි

අපිට රචනා

මල් පිනිති

පාට

My Strength

පුදුමයි හරි පුදුමයි

අපි ඔක්කොම යාලුවෝ

අපේ ගමන

Goblin

Riddles for kids

අපේ පාසල් චාරිකාව

# පිදුම

මාගේ ආදරණීය දෙමව්පියන්ද

දයාබර මල්ලි තේමිත

නංගි එවින්යා සහ

ආදරණීය අත්තම්මාට සහ අත්තාටත්

මාගේ ගුරුවරුන්ටත්

පුදමි.

# මී පැංචාට උදව්වක්

දවසක් දා මමයි මල්ලියි මැද මිදුල දිහා බලාගෙන ඉන්න විට පුංචි මී පැංචෙක් මැද මිදුලට වැටුණා.



"අනේ දැන් හරි වැඩේ"

අහ්! කියන්න බැරිවුණා. එදා වැස්ස දවසක්.



ඉතින් මී පැංචා මැද මිදුලේ බිත්තිය දිගේ නගින්න හදනවා. ඒත් බෑ. අපි මී පැංචාට උදව් කරන්න හිතලා අම්මාට කතා කළා. අම්මා ඉක්මනට ආවා. අම්මාට විස්තරේ කිව්වා. අම්මත් හරියට දුක් වුණා.



ඉතින් අපි මී පැංචාට උදව් කරන්න හිතුවා. ටක් ගාලා ලී කොට්ටක් ගත්තා.

ඊට පස්සේ ඒක දික් කළා. ඒක දිගේ මී පැංචා උඩට උඩට ගියා.



අපිට ගොඩාක් සතුටුයි. මී පැංචාටත් සතුටුයි.

එදා අම්මා කිව්වා අසරණ අයට උදව් කරන එක හොඳ දෙයක් කියලා.





# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට

පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිගානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

“දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01